# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

India's National Spiritual Newspaper

₹ 10/-

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE (ECHO GROUP)

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVI YEAR OF OUR LORD JESUS CHRIST, MAY 2022 Issue No. 6


## ශුද්ධවූ බයිබලය

**(හිතෝපදේශ 22:1-10)**

1. රන්රිදී වලට වඩා කරුණාවද අගනේය.

2. පොහොසතාද දුප්පතාද සම්මුඛ වෙති. ඔවුන් සියල්ලන්ගේ මැවුම්කාරයා ස්වාමින්වහන්සේය.

3. නුවණ ඇත්තා විපත්තිය දැක සැඟවෙයි. එහෙත් අනුවණයෝ නොනැවතී ගොස් අච්චු ලබති.

4. යටත්කමේ ස්වාමින්වහන්සේ කෙරෙහි භයවීමේද විපාකය නම් වස්තුවත් ගෞරවයත් ජීවිතයත්ය.

5. කටුගස්ද මලපත්ද වංක අයගේ මාර්ගයෙහි ඇත. තමාගේ ප්‍රාණය ආරක්ෂාකරගන්නා ඒවායින් දුරව සිටියි.

6. දරුවෙකු සුදුසු මාර්ගයෙහි පුහුණු කරපන්න. එවිට ඔහු වයස්ගත වූ කළත් එයින් අහක්ව නොයන්නේය.

7. වස්තුකාරයා දිළිඳුන් කෙරෙහි ආණ්ඩු කරන්නේය. ණයගන්නා ණයදෙන්නාට මෙහෙ කරන්නේය.

8. අයුක්තිය වපුරන්නා විපත්තිය කපා ගන්නේය. ඔහුගේ උදහස නමැති ඉපල නැති වන්නේය.

9. කරුණා ඇසක් ඇත්තාට ආශිර්වාද ලැබේ. මක්නිසාද ඔහු තමාගේ කෑමෙන් දිළින්දට දෙන්නේය.

10. නින්දා කරන්නා පන්නා දමාපන්න. එවිට තරඟය පහවේ. එසේය විවාදයත් ලජ්ජාවත් නවතියි.

# අප ජීවත්වන්නේ අවසාන කාලයෙහිද?

(සහෝදර එම්. පෝල් රාජ් විසිනි)

ARE WE LIVE IN THE LAST DAYS?



රුසියානු හා යුක්රේන් අතර ඇති යුද්ධය නිසා අද ලෝකය ඉරී ඇත. (දෙකඩ වී ඇත.) මෙම යුද්ධය ආරම්භ වූයේ 2022 පෙබරවාරි මස 24 වැනි දිනදීය. එම යුද්ධය තවමත් සිදු වෙමින් පවතී. මාර්තු මස 5 වන දිනට පැය 7 ක සටන් පිරුමයක් තිබුණ ද එහිදී සිදු වූයේ විදේශ රටවලින් පැමිණි සිටි ශිෂ්‍ය ශිෂ්‍යාවන් නැවත එම රටවලට පිටත්කර යැවීමයි. යුද්ධයේ පළමු දිනදී රුසියාව ඉතා පහසුවෙන් යුක්රේන් වලට ඇතුලු වූවත් එහිදී ඔවුන් ඉතා මහත් විරෝධතාවයන් වලට මුහුණ දෙනු ලැබුවේය. මාර්තු 21 වන දින වන විටදී යුද්ධය 26 වැනි දින පසු කරන ලදී. යුක්රේන්ට ඔවුන්ගේ මිත්‍ර රටවල් ආයුධ සන්නද්ධ වීමට උපකාර කල නිසා රුසියාව ඉතා අසීරු තත්ත්වයකට මුහුණ දෙනු ලැබුවේ රුසියාවට තිබූ විරුද්ධතාවය නම්, යුක්රේන් නේටෝ (NATO) සංවිධනයට ඇතුල් වීමට තීරණය කල නිසාය. බොහෝ යුරෝපීය රටවල් රුසියාව වටකර තිබූ නිසා යුක්රේන් නේටෝ (NATO) සංවිධානයට සමබන්ධ වූවත් ඒක ඔවුන්ගේ ආරක්ෂාවට බලවත් තර්ජනයක් විය. ඇමරිකාව සහ අනෙකුත් රටවල් රුසියාවට විරුද්ධය ආර්ථික තහනමක් පනවා ඇත. සමහර යුරෝපය රටවල් වන බ්‍රිතාන්‍ය හා ජර්මනිය යුක්රේනයට ආයුධ දෙමින් උපකාර කරනු ලබයි. ජෝ බයිඩන් ජනාධිපති තුමා (NATO) රටවල් මෙයට සෘජුවම උපකාර කිරීමෙන් වලකින්නය කියා පවසනු ලැබුයේ, මෙම යුද්ධය තුන්වන මහා ලෝක යුද්ධයක් බවට පරිවර්තනය වීමට හැකියාවක් තිබෙන නිසාය. මෙය සමහර විට වෙනස් වීමට ද හැකිය. මන්ද ලෝක නායකයෝ බ්‍රිසීලයෙහිදී එකතු වී පවතින්නාවූ තත්ත්වය ගැන විමර්ශනයක් කරමින් සිටී. යුක්රේනයට විරුද්ධව රුසියානුවන් රසායනික හා නවීන බෝම්බ පාවිච්චි කරමින් සිටී. රුසියානු මනුෂ්‍යයන් ලෝක නායකයන් පවසන්නාවූ කාරණාවන් ඇසීමට සූදානම් නොමැති බවක් පෙනී යයි.

යුක්රේන් ජනාධිපති වන වොලෝඩ් මෙයර් සීලෙනසකයි පෙරදී විකට නළුවෙක්ව සිටිය ද දැනු ඔහු රටේ ජනාධිපතිය. මෙම යුද්ධයේදී මුළු රටම ඔහු සමග සිට ගනී. මෑතකදී ඔහු ඉශ්‍රායෙල් පාර්ලිමේන්තුවේදී කථාවක් පවත්වමින් ඔහුගේ මුත්තන් යුද ජාතිකයින් නිසා ඔහුට මෙම යුද්ධයේදී උපකාර කරන්නය කියා ඉල්ලා සිටියේය.

අප්‍රියෙල් මස 2 වන දින ඉශ්‍රායෙල් අගමැති තුමා ඉන්දියාවේ අගමැති තුමාගේ ආරාධනයක් මත ඉන්දිය දේශයට පැමිණුනේය. යුක්රේන් හා රුසියානු

3 වෙනි පිටුවට ...

# ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

*from your dearly beloved brother...*

(ECHO GROUP)



## කැඳවීමේ ප්‍රතිරාවය

"ස්වාමින්ගේ දකුණු හස්තය උසස්ය. ස්වාමින්ගේ දකුණු හස්තය වික්‍රමාන්විතව ක්‍රියා කරයි." (ගීතාවලිය 118:16)



**ස්වාමින්වහන්සේ තුළ ප්‍රිය මිත්‍රවරුනි,**
**අපගේ ස්වාමිවූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බලවත්වූ නාමය ඔබට සුභ පැතුම් ගෙනෙමි.**

ඔබගේ යාච්ඤාව හා උපකාරයන් ඔබ දක්වන නිසා අපි ඔබට ගරු කරමි. ඔබ උසෙසා යාච්ඤා කරමු. ඔබට ස්තුති කරමි.

ඉන්දියාවේ සිටින සියළු දරුවන් හා තරුණ තරුණියන් මැයි මස තමාගේ නිවාඩුව ඉතා සතුටින් ගත කරනවා ඇත.

මේ නිවාඩු කාලයේදී ලෝකයේ දේ සඳහා කාලය වැය නොකර ඔබත් ඔබගේ දරුවන්වත් දෙවියන්වහන්සේට ප්‍රයෝජනවත් දෙයක් ගත කරන පිණිස ක්‍රියා කරන්න. ඔබගේ සභාවේ කිසියම් වැඩ කටයුත්තක් තිබේනම් ඔබ එයට උපකාර කරන්න. දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ කටයුතු උදෙසා ඔබ යමක් කරනවානම් දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක. ඔබගේ දේව දාසයන් වන අපද බොහෝ කාර්ය බහුලව දෙවියන්වහන්සේ රාජ්‍යයේ කටයුතු වල යෙදී සිටිමු. අපගේ ඉංග්‍රීසි පාසලේ දෙමළ භාෂාවෙන් සවස් කාලයේ පවත්වන බයිබල් පංතිය හින්දි Online බයිබල් පංතිය ආදී සෑම දේම ඉතා හොඳින් පවත්වාගෙන යන අතර කැඳවීමෙ ප්‍රතිරාව සඟරාවද භාෂා 16කින් අප නිකුත් කරමු. ලබන මාසයේ සිට හින්දි භාෂාවෙන් බයිබල් විදුහල ආරම්භ කරමු. මේ සියල්ල උදෙසාම ඔබගේ යාච්ඤාව අපට අවශ්‍යව ඇත.

අප ඔබගෙන් ඉල්ලීමට පෙර බොහෝ දෙනා අපගේ අවශ්‍යතා දැනගෙන අපට උපකාර කරන්නේය. බොහෝ අය බැංකු හරහා ද මනි ඕඩර් හරහා සහ චෙක් මාර්ගයෙන් අපට උපකාර කරයි. මේ තුළින් ඔබ අපව ධෛර්‍යමත් කරන නිසා අප ඔබට ස්තුති කරමු. යහපත්කමත් කරුණාවත් ඔබ අනුව එන්නේය.

අපගේ සාමාජික පවුල්වල සමහර පුද්ගලයින් ශාරීරිකව දුර්වල වී සිටින හෙයින් ඔවුන් උදෙසා යාච්ඤා කරන්න. සහෝදර පෝල් රාජ් හා පාස්ටර් මුත්තුගේ සුවය උදෙසා යාච්ඤා කරන්න.

අපි ඔබට ප්‍රේම කරන අතර ඔබ උදෙසා යාච්ඤා කරමු. ඔබගේ ලිපි දුරකතන ඇමතුම්, ඊමේල් හා සියලු උදවු උපකාරයන් නිසා ස්වාමින්වහන්සේට ස්තුති කරමු. ඔබගේ සියලු අවශය හා උදෙසා අපි යාච්ඤා කරමු. දෙවියන්වහන්සේග් කරුණාව ඔබ සමග පවතීවා.. ආමෙන්

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**

**පාස්ටර් සැම් සෙල්වරාජ් සහ ඇලෙස්ත් සැම්සන් සැම්**

(+91) 98412 71858 / 98410 71858, E.mail : samselvaraj333@gmail.com



### OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

**CHIEF EDITOR**
Angeline Selvakumari Henry, M.A., M.Ed.

**MANAGING EDITOR**
Pastor Alex Samson Sam, B.Th., M.Div.

**ADMINISTRATION**
Bro. N. Prakasam, M.A., General Manager

**EDITORIAL BOARD**
Sis. Jesy Veena Sam
Bro. M. Paulraj, M.A., B.Ed.
Sis. Serena Bevin, M.A., M.Phil., B.Ed.

**EDITOR, PUBLISHER & PRINTER**
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 95661 31858

**E.mail ID**
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in

**WEBSITES**
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com

**YOUTUBE CHANNEL**
Echo of His Call

**Our Ministries:** ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ✿ BIBLECOR - Postal Courses (3 languages) ✿ Online Courses ✿ Theological Correspondence Courses (2 languages) ✿ Church Planting ✿ Nehemiah Bible Colleges ✿ Gospel Printing Press ✿ Great Commission Partners ✿ St. Paul's Matriculation School ✿ Crusades ✿ Community Development

*1 පිටුවෙන්....*

යුද්ධයේදී ඉන්දියාව මධ්‍යස්ථව සිටින නමුත් ඔවුන්ට මානුෂීය උපකාර කිරීමට සූදානම් ව ඇත.

මෙම යුද්ධය 26 වන දිනත් පසුකල මුත් සමහර විටදි මෙය ගෝලීය යුද්ධයක් දක්වා පැතිරීමට ඉඩ ප්‍රස්ථාව ඇත. රුසියාව ඔවුන්ගේ පරම සතුරා වන ඉශ්‍රායලයට විරුද්ධව ගියහොත් එය 3 වන මහා ලෝක යුද්ධයක් වනු ඇත. යුක්‍රේන්හි ජනාධිපතිතුමාට අනුව ඉශ්‍රායෙලයට ඕනෑම රටකට විරුද්ධව සටන් කිරීමට බලය ඇත. එම නිසා රුසියාව ඉශ්‍රායෙලයට පහර දුන්නහොත් මතු කාලයේදී එය කුමන අතකට පෙරලෙයි ද කියා නොදනී.

ශුද්ධ වූ බයිබලයෙහි සඳහන්ව ඇති අර්මෙගදොන් යුද්ධය අනුව රුසියාව ඉශ්‍රායලයට විරුද්ධව එන බව පවසයි. මෙම යුද්ධයේදී ඉශ්‍රායෙලය ජයග්‍රහනය ලබා රුසියාවේ ආයුධ හා යන්ත්‍ර සියල්ලම වසර 7ක් දර පිණිස පාවිච්චි කරනු ලබයි. මේ දිනවලදි රුසියාව නෝර්වේ රටින් ගෙන්වා ගත් විශේෂ ලී වර්ගයක් පාවිච්චි කරමින් යුද්ධය සඳහා අහස් යාත්‍රා සාදනු ලබයි. මෙම ලී බරින් සැහැල්ලු නමුත් ඉතා ශක්තිමත් වූ ලී වර්ගයකි. ***(එසකියල් 38-39)*** මේ සියලු දේම සිදු වනුයේ දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුවය. එම නිසා ලෝකයේ මනුෂ්‍යයන්ගේ ආරක්ෂාව පිණිස අපි යාච්ඤා කරමු.

දැනට තිබෙන්නාවූ යුද්ධය සමහර විට නිමාවට පත් වුවද එළිදරව් පොතෙහි දෙවියන්වහන්සේ පවසා ඇති පරිදි මුද්‍රා සත කැඩීමෙන් හොරණෑ සත පිඹීමක් හා යන සියලුම දේ යුද්ධය ආරම්භ වීමට පෙර සිදුවන්නට ඕනෑය. පළමු මුද්‍රා 2 කඩන කාල පරිච්ඡේදය තුල දැන් අපි ජීවත්වන බව මා විශ්වාස කරමි. 1 වන මුද්‍රාව කඩනු ලබන්නේ වසර 7ක පීඩා කාලයේ පළමුවන ආදියරේදීය. එම නිසා අප මේ ජීවත්වන්නේ පළමු මුද්‍රා 4 කඩන කාලයේදී බව මා තදින්ම විශ්වාස කරමි. මන්ද යුක්‍රේන් හා රුසියානු යුද්ධය හටගෙන ඇත්තේ මේ නිසාය. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මතෙව් 24 වන පරිච්ඡේදයෙහිදී ලෝකය අවසානයටත් උන්වහන්සේගේ ඊමටත් පෙර නෝවාගේ කාලයේ සිදු වූවාක් මෙන් බොහෝ දේ සිදුවෙයි කියා ඉතා පැහැදිලිවම සඳහන් කර තිබේ. දෙවියන්වහන්සේ නෝවාට කතා කරමින් ලෝකය විනාශ කිරීමට සූදානම්ව සිටින නිසා ඔහු හා ඔහුගේ පවුලේ අය ගැලපෙන පිණිස නැවක් සාදන්නය කියා පවසනු ලැබීය. නෝවා සහ ඔහුගේ පවුල දෙවියන්වහන්සේට කීකරු වූවා මෙය ඉටු වීමට වසර 100 ක් ගත විය. මේ කාලයේදී ජීවත්ව සිටි සෙනඟ නෝවාගේ ක්‍රියාවට විහිළු කලා නමුත් නෝවා මනුෂ්‍යයන්ට පසුතැවිලි වන්නය කියා දේශනා කර ඔවුන්ට නැවට ඇතුලුවන්නය කියා පවසනු ලැබීය. ***(2 පේ‍්‍රතෘස් 2:5)*** නෝවාගේ මෙම ඉල්ලීමට ද කිසිවෙක් කන් දුන්නේ නැත. දෙවියන්වහන්සේ අණකල පරිදි නැව සාදා නිම කරනු ලැබීය.

යේසුස්වහන්සේ පවසනු ලැබුයේ ජල ගැල්ම පැමිණෙන තුරු මිනිසුන් කමින් බොමින් සරණපාවා ගනිමින් සරණපාවා දෙමින් ජීවත් වූවා ය කියාය. නෝවා සහ ඔහුගේ පවුලේ අට දෙනාම ඒ නැවට ඇතුල් වූ පසු දෙවියන්වහන්සේ එම නැවේ දොර වසා දැමුවේය. අනෙක් සියලු දෙනාම ජල ගැල්මෙන් විනාශ විය. ***(මතෙව් 24:37-39)***

අද වර්තමාන ලෝකය තුල මිනිසුන් ජීවත්වන්නේ ද නෝවගේ කාලයේ මනුෂ්‍යයන් ජීවත්වූ ලෙසටමය. ලෝකයා අද දෙවියන්වහන්සේගේ හඬට ඇහුම්කන් නොදෙති. එසේනම් අප ජීවත්වන්නේ මේ අවසාන කාලයේ නොවේ ද?

අද අපට තිබෙන්නාවූ විශාලතම ප්‍රශ්නය නම් යේසුස්වහන්සේ නැවත පැමිණෙන්නේ කවදාද ? යන්නයි. මේ පිළබඳ වූ බොහෝ අය සිතන්නාවූ කාරණය නම්, අවුරුදු හතේ පීඩා කාලයට පෙර අන්ත ක්‍රිස්තුස්ගේ පීඩා කාලයට පෙර යේසුස්වහන්සේ පැමිණෙයි කියාය. තව සමහරු ***2 තෙසලෝනික 2:1-3*** හි සඳහන් කර ඇති පරිදි විරුද්ධ ක්‍රිස්තුස් පීඩා කාලයේදී මැද භාගයේ දී පැමිණෙන බවයි. යෙසුස් වහන්සේ පීඩා කාලයේ අවසානයේදී උන්වහන්සේ පාදය ඔලිව් කඳු මුදුනේ තබයි. විරුද්ධ ක්‍රිස්තුස්ට විරුද්ධව හර්මෙගදොන්හිදී යුද්ධ කරනවා ඇත. එළිදරව් පොතෙහි කියා ඇති පරිදි මුද්‍රා සත කඩනු ලබන්නේ කවදාද? බොහෝ දෙනා මාගේ නාමයෙන් පැමිණ බොහෝ අයව මුලා කරයි. කියා යෙස්සුවහන්සේ පැවසූ සේක. ***(මතෙව් 24:5)*** විරුද්ධ ක්‍රිස්තුස්ගේ ආත්මය මෙයයි. දැනටම මෙම විරුද්ධ ක්‍රිස්තුස්ගේ ආත්මය ක්‍රියා කරනු ලබයි.

## පළමු මුද්‍රාව

බැටළුපැටවාණන් මුද්‍රා සතෙන් එකක් කැඩූ කල යොහාන්, සුදු අශ්වයෙක් ද ඌ පිට සිටි තැනැත්තාට දුන්නක් ද ඔටුන්නක් ද දෙනු ලැබූ බව දුටු අතර ඔහු ජය ගනිමින් ද ජයගන්න පිණිස ද පිටත්ව ආවේය කියා කියන ලද්දේය. ***(එළිදරව් 6:1-2)*** මෙම සුදු අශ්වයා පිට සිටි තැන්ත්තා විරුද්ධ ක්‍රිස්තුස් නොවන නමුත් මේ ලෝකයේ ජාතීන් පිළිගත් නායකයෙකි. ඔහු ආත්මයක් නොවන නමුත් රජ කෙනෙක්, ජනාධිපති කෙනෙක් හෝ අගමැති කෙනෙක් විය හැකිය. නමුත් මොහු විරුද්ධ ක්‍රිස්තුස්ගේ ආත්මය සමඟ ක්‍රියා කරනු ලබයි. යොහාන් ජීවත් වූ පළමු ශතවර්ෂයේදී මේ සම්බන්ධව ලියා ඇත්තේ මේ නිසාය. ***"ප්‍රිය දරුවෙනි, මේක අන්තිම කාලයය. විරුද්ධ ක්‍රිස්තුස් එන බව නුඹලා ඇසූ ලෙසම දැනටම***


**NEHEMIAH BIBLE**

**Pray for RESIDENTIAL / EVENING COLLEGE,**
Velachery / Chepauk & Santhoshapuram, Chennai.

Medium : Hindi / Tamil

*Registered Candidate for Membership*
Asia Theological Association (ATA)
Recognised by International Christian Leaders &
Senior Pastors for the past 53 years

**Certificate in Theology : One year**
**Diploma in Theology : Two years**

Qualification : 10th Standard & above
**Rush for admission!**

**Contact : The Chairman, Nehemiah Bible College.**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org
✶ ONLINE CLASSES ARE AVAILABLE ✶

***බොහෝ විරුද්ධ ක්‍රිස්තුස්වරු නැගිට සිටිති, මෙයින් මේක අන්තිම කාලය බව අපි දනිමුව.'' (1 යොහාන් 2:18)*** පියාණන්වහන්සේව හා පුත්‍රයාණන්වහන්සේව එපාකරන තැනැත්තා විරුද්ධ ක්‍රිස්තුස්ය. ***(1 යොහාන් 2:22)*** ලෝකයා කෙරෙන් බිහිවන විරුද්ධ ක්‍රිස්තුස් තවම පැමිණ නැත. නමුත් විරුද්ධ ක්‍රිස්තුස්ගේ ආත්මය දැනටමත් ක්‍රියා කරති. මෙවැනි අය දැනටමත් අපව දකිමට හැකිය. මෙම සුදු අශ්වයා පිට සිටින තැනැත්තා සමග ***එළිදරව් 19:11*** හි යේසුස්වහන්සේ පිළිබඳව ඇති කාරණය යන මේ දෙක එකට පටලවා නොගත යුතුය.

## දෙවන මුද්‍රාව

***එළිදරව් 6:3-4*** දක්වා පවසා ඇති පරිදි මෙම තැනැත්තාට ලෝකයේ තිබෙන සමාදානය ඉවතට දමා එකිනෙකාව මරා දැමීමට බලය තිබුනේය. වසර දහස් ගණනකට පෙර සිටම ලෝකයෙහි මෙවැනි තත්වයක් උදාවී තිබේ. දැනටම මේ තත්ත්වයට ලෝකය පත්වී ඇත.

## තුන්වන මුද්‍රාව

මෙම මුද්‍රාව කැඩූ විට කළු පාට අශ්වයෙක් පිට නැගුන පුද්ගලයෙක් පැමිණි අතර ඔහුගේ අතේ තරාදියක් තිබුනේය. ඔහුට මේ ලෝකයේ ආහාර හිඟයක් ඇති කිරීමට බලය තිබුනේය. අද අපට මේ දේ බොහෝ රටවල දැකීමට හැකිය. අප්‍රිකානු රටවල් වල විටින් විට අපට මෙවැනි ආහාර හිඟයන් දකිමු. ඉතියෝපියාව, සූඩානය, සෝමාලියාව යන රටවල් මෙයට හොඳ උදාහරණයන්ය. මෑතකදී හයිටි යන දූපතේ ගිණිකන්දක් පිපිරියාමක් හා සුනාමි පැමිණීමත් නිසා මහත් ව්‍යසනයකට ඒ රටේ ජාතීන් පත්විය. ඔවුන් කෑමට ගනු ලැබුයේ මැටි වලින් සෑදූ පාන්ය. ශ්‍රී ලංකාවේද මෑත කාලයේ දී ආර්ථික අර්බුදයකට මුහුණ පා සිටින බැවින් ආහාර හිඟවීමේ භයානක තත්ත්වයකට මුහුණ දීමට සිදුවනු ඇත. ඇෆ්ගනිස්ථානයද මෙවැනි තත්වයක පවතී. කොවිඩ් 19 පසුව ලෝකයේ බොහෝ ස්ථාන වල මෙවැනි ආහාර හිඟයක් පවතිමින් තිබේ.

බිල් ගේට් සහ තවත් කෝටිපතිවරු ඇමෙරිකාවේ සහ වෙනත් රටවල තිබෙන විශාල කෘෂිකාර්මික ඉඩම් රැගෙන එහි කෘෂිකාර්මික කටයුතු කරමින් සිටී. දැනටම ඔවුන් ගෝධුම බීජ (බිත්තර වී) පාලනය කරන තත්ත්වයකට පැමිණ සිටී. ඉන්දියාවෙහි සිටින කෝටිපතිවරුන්ටද ඔවුන් පවසා සිටින්නේ. ආහාර නිශ්පාදනය සඳහා මෙවැනි කටයුතු වල නියැලී විශාල ව්‍යාපාර කටයුතු වල නියැලෙන්නය කියාය. නමුත් ඔවුන් මෙම ඉඩම් පරීක්ෂා නොකරමින් ඉඩම් සියල්ලම මිලදී ගනී. දැනටම රුපියල් 50/- කට විකුණූ සහල් කිලෝවක් රුපියල් 500/- දක්වා ඉහල යාමට හැකිය. එනම් මෙවැනි ආහාර හිඟවීමත් සමගම මේ තුන්වන මුද්‍රාව සහිත මනුෂ්‍යයා ක්‍රියා කරන බව අප සැමටම පැහැදිලිවම පෙනී යයි.

## හතරවන මුද්‍රාව

මෙම මුද්‍රාව කැඩූ කල සුදුමැලි අශ්වයෙක් පිට පුද්ගලයෙක් සිටින බවත් ඔහුගේ නාමය මරණය වූ අතර පාතාලයද ඔහු අනුව ගියේය. කඩුවෙන්ද සාගතයෙන්ද වසංගතයෙන්ද පොළොවේ වනමෘගයන් ලවාත් මරන්ට පොළොවෙන් සතරෙන් කොටසක් කෙරෙහි ඔහුට බලය දුන්නේය.

1918 සහ 1945 හි ඇතිවූ ලෝක මහා යුද්ධයන් කරණකොටගෙන ලක්ෂ ගණන් සෙනග මිය ගියේය. ඉන් පසුවද ලෝකයේ විවිධ තැන්වල යුද්ධය නිසා දහස් ගණන් මිනිසුන් මිය ගොස් ඇත. යුක්‍රේන් හා රුසියාව අතර තවමත් යුද්ධය පවති. HIV, HIVI, ඉන්ෆ්ලුවෙන්සා වෛරසය (1918)ල H2N2 වෛරසය (1957) Zika වෛරසය (2018) වෛරස් උණ 1968 (2020) සහ NIPHA වෛරසය (2021) සහ වර්ථමානයේදී කොවිඩ් 19 වෛරසය නිසාද මිලියන ගණන් ජීවිත අහිමි විය. මෙහි සඳහන් මෘගයා (සතුන් මගින්) විසින් මෙවැනි වෛරස් පතුරුවනු ලබයි. වෛරසයක් ශරීරගත වූ විට එය ලේසියෙන් නොමැරෙනු ඇත. මන්ද අදවන තුරු සමහර වෛරස් ක්‍රියා කරන බව අපි දනිමු.

## පස්වන මුද්‍රාව

දෙවියන්වහන්සේගේ වචනය නිසාද තමන් දැරූ වචනය නිසාද මරණු ලැබූවන්ගේ ආත්ම පූජාසනය යට තිබෙනවා දුටුවේය. වසර තුනහමාරක (3 2/1) පීඩා කාලයේදී දෙවියන්වහන්සේගේ වචනය නිසාද උන්වහන්සේගේ සාක්ෂිය නිසාද වේද සාක්ෂිකාරයන් ලෙස මැරුණ අයගේ ආත්ම මේය. තවද යේසුස්වහන්සේගේ සභාව ඔසවා ගනු ලැබුවාට පසුව මේ මුද්‍රාව කඩනු ලබනවා විය හැකිය.

## හයවන මුද්‍රාව

මෙතෙක් කඩනු ලැබූ මුද්‍රාවන්ට වඩා භය වන මුද්‍රාව කැඩූ කල සිදුවෙන්නාවූ දේවල් ඉතාම භයානක වූ දේවල්ය. මතෙව් ශුභාරංචියේ 24 වන පරිච්ඡේදයේ මේ ගැන ඉතා සවිස්තරාත්මකව සඳහන් වන අතර එළිදරව් 6:12-17 දක්වා පදවල මෙසේ සඳහන්ව ඇත.

*6 වෙනි පිටුවට ...*

**NEHEMIAH BIBLE COLLEGE**
**Pray for** of ECHO OF HIS CALL
(RESIDENTIAL-HINDI & EVENING-TAMIL)
Asia Theological Association (ATA)
*Registered Candidate for Membership*
23rd Graduation Service
on 3rd June, 2022
Friday, 5:00 P.M.
at Balar Kalvi Nilayam Hall,
M.R.C. Centre, Anitha Matriculation
School Compound, 5/6, Ritherdon Road,
Vepery, Chennai - 600 007.
Pray and Participate!
- Admissions started for the year 2022-2023!
- Please recommend deserving students!!
- Scholarship available for Residential Hindi students!!!
- Classes for the academic year 2022-23 will commence on 06.06.2022!!!!
Contact : Pr. S. Sam Selva Raj, President

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

බෙදා ගැනීම (ගලාති 6:2)
උපකාර කිරීම (රෝම 12:13) සහ
පුබුදු කිරීම (2 තිමෝති 1:6)

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**මැයි:19-** කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවයේ සියලුම සේවකයන් ගැන ස්තුති කරන්න.

**මැයි:20-** කැපවීමෙන් සේවය කරන දේව සේවකයන් ගැන ස්තුති කරන්න.

**මැයි:21-** ධර්මදූත සේවයේ යෙදෙන සෑම අයෙක් ගැන ස්තුති කරන්න.

**මැයි:22**- මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී සිට, පසුව යේසුස්වහන්සේ අදහාගෙන ඉන් නිදහස් වී සිටින අය ගැන ස්තුති කරන්න.

**මැයි:23**- ජීවනයේ වචනය අසන පිණිස යේසුස් වහන්සේ ළඟට පැමිණෙන මනුෂ්‍යයන් ගැන ස්තුති කරන්න.

**මැයි:24**- යාච්ඤා මැදිහත්කරුවන්ගේ සේවය තුළින් දේශයට ඇති ආශිර්වාස ගැන ස්තුති කරන්න.

**මැයි:25**- භාෂා 17 කින් මුද්‍රණය වන කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවය ගැන ස්තුති කරන්න.

**මැයි:26**- ස්වාමීන්වහන්සේ කෙරෙහි දේව භයෙන් හා ගෞරවයෙන් ජීවත්වන කිතුණුවන් ගැන ස්තුති කරන්න.

**මැයි:27**- සාතන්ගේ අන්ධකාරයේ හිරගෙයින් නිදහස් වී යේසුස්වහන්සේගේ ආලෝකයට පැමිණෙන මනුෂ්‍යයන් ගැන ස්තුති කරන්න.

**මැයි:28**- මිෂනාරිවරුන්ගේ කැපවීම් ගැන ස්තුති කරන්න.

**මැයි:29**- කිතුණුවන් නිතරම ප්‍රීතිවෙන්න, නොකඩවා යාච්ඤා කරන්න. සියල්ලේදී ස්තුති කරන්න.

**මැයි:30**- ගෝලත්ව සේවයේ යෙදී සිටින වර්තමාන කිතුණු ගෝලයන් ගැන ස්තුති කරන්න

**මැයි:31**- මැය මාසය පුරාම දෙවියන්වහන්සේ තුළින් ලැබූ ආශිර්වාද ගැන ස්තුති කරන්න.

### 2022 ජූනි මාසය

**ජූනි:01-** දේවධර්මානුකූල ඉගැන්වීම් ගැන ස්තුති කරන්න.

**ජූනි:02-** බයිබල් විදුහල් වලින් අධ්‍යනය ලබා දේව ධර්මය උගන්වන ගුරුවරුන් ගැන ස්තුති කරන්න.

**ජූනි:03-** කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවයේ නිර්මාතෘ සෑම් සෙල්වරාජ් ඇතුළු පවුලේ අය ගැන ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**ජූනි:04-** දේව වචනය අධ්‍යනය කිරීමට ආශාවක් කිතුණුවන්ට ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:05-** මනුෂ්‍යයන් නපුරු මාර්ගවලින් හැරී දෙවියන්වහන්සේ වෙතට පැමිණෙන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:06-** බේබදුකමට වැටී සිට ඉන් නිදහස් වී ගැලවීම ලබා ගත් අය ගැන යාච්ඤා කරන්න.

**ජූනි:07-** ග්‍රාමීය ප්‍රදේශ වල සේවය කරන දේව සේවකයන්ගේ ආරක්ෂාව උදෙසා යාච්ඤා කරන්න.

**ජූනි:08-** ගුරුවරුන්ගේ ගෞරවනීය සේවය ගැන යාච්ඤා කරන්න.

**ජූනි:09-** බොහෝ ආර්ථික ප්‍රශ්න හා දිළිඳුකමින් යුක්තව ජීවත්වන අය උදෙසා යාච්ඤා කරන්න.

**ජූනි:10-** ජනාධිපතිතුමා ඇතුළු දේශපාලන නායකයින් ගැන යාච්ඤා කරන්න.

**ජූනි:11-** බෝනොවන රෝග වලින් පීඩා විඳින අය ගැන යාච්ඤා කරන්න.

**ජූනි:12-** රැකියා විරහිත සියලු දෙනාටම සුදුසු රැකියාවක් ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:13-** මේ වසරේදී බයිබල් විද්‍යාවලට ඇතුල්වී සිටින සිසු සිසුවියන් ගැන යාච්ඤා කරන්න.

**ජූනි:14-** කිතුණුවන්ට ශාරීරික හෝ මානසික පීඩාකරන්නන් එයින් ඉවත්වන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:15-** නැවුම් ශුද්ධාත්ම ආලේපයක් සෑම දේව සේවයෙකුටම ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**ජූනි:16-** පීඩා තුළින් ගමන් කරන කිතුණු සභාපලාකවරුන් ගැන යාච්ඤා කරන්න.

**ජූනි:17-** අපට පුද්ගලිකව වැරදි කළ අයට සමාව දී යාච්ඤා කරන්න.

**ජූනි:18-** ක්‍රිස්තුස් වහන්සේගේ දෙවෙනි ඊමට සෑම කිතුණුවෙක්ම සූදානම්ව සිටින පිණිස යාච්ඤා කරන්න.

4 පිටුවෙන්....

1. මහත් වූ භූමිකම්පාවක් විය. සූර්යා කේශ කම්බලයක් මෙන් කළු විය. මුළු හඳ ද ලේ මෙන් විය.

2. අත්තික්කා ගසක් තද සුළඟකින් සෙලවී එහි අකාල එල වැටෙන්නාක් මෙන් අහසේ තාරකා පොළොව පිට වැටුණේය.

3. අකුලනලද පොතක් මෙන් අහස පහකරනලද්දේය, සියලු කඳුද දිවයින්ද ස්වකීය ස්ථානවලින් පහකරන ලද්දේය.

4. පොළොවේ රජවරුද උත්තමයෝද සේනාපතියෝද ධනවන්තයෝද බලවන්තයෝද සියලු දාසයෝද නිර්දාසයෝද කඳුවල ගුහාවලත් පර්වතවලත් සැඟවුණෝය.

5. ඔව්හු කඳුවලටත් පර්වතවලටත් කථාකොට, අප පිට වැටී, සිංහාසනයෙහි වැඩ ඉන්න තැනැන්වහන්සේගේ මුහුණ ඉදිරියෙනුත් බැටළු පැටවාණන්ගේ උදහසිනුත් අප සඟවාගනිල්ලා.

6. මක්නිසාද උන්වහන්සේගේ උදහසේ මහත් දවස් පැමිණුන බැවින් සිටින්නට පුළුවන් කාටදැයි කීවෝය.

ප්‍රිය මිත්‍රවරුනි, මෙවැනි විපත් සිදුවෙනවා හෝ දැන් සිදුවෙමින් තිබෙනවා හෝ එය සිදුවෙන්නට යනවා ඇත. මීට වසර 50කට පෙරදී අප මෙවැනි දේ දුටුවේ නැත. නමුත් මේ මෑත කාලයේ සිට මෙවැනි දේවල් සිදුවීම අත්දකිමින් සිටිමු. මෙය කොයි වේලාවකදී හෝ සිදු වීමට පුලුවනි. මන්ද දෙවියන්වහන්සේට එක දවසක් අවුරුදු 1000 ක් ලෙසත් අවුරුදු 1000ක් එක් දවසක් ලෙසද සැලකේ. එබැවින් මේවා කොයි මොහොතක හෝ සිදුවෙන්නට පුළුවනි.

## හත් වන මුද්‍රාව

උන්වහන්සේගේ සත්වන මුද්‍රාව කැඩූ කල ස්වර්ගයෙහි පැය භාගයක් පමණ නිශ්ශබ්දතාවයක් විය. ***(එළිදරව් 8:1)*** මෙහි දේවදූතයන් සත්දෙනෙක් සිටි අතර ඔවුන්ට හොරණෑ සතක්ද දෙන ලද්දේය. මෙහි පැය භාගයක නිශ්ඞබ්ද කාලයකය කියා සඳහන් කරනුයේ, මෙම මුද්‍රාව කැඩීම කරණකොටගෙන සිදුවෙන්නට යන්නාවූ දේ පිළිබඳව ලෝකයා දැනගන්නා පිණිසය. මෙම නිහඬ කාලයෙන් පෙන්වන්නේ, ඉදිරියේදී හොරණෑ නාද සතක් හා දෙවියන්වහන්සේගේ උදහස පොළොව මත වගුරුවන බවයි. බයිබල් විශාරදයෝ පවසන්නේ, හොරණෑ නාදය පිඹින්නේ වසර තුනහමාරක (3 2/1) ක පීඩා කාලයට පසුව බවයි.

පළමු අවුරුදු තුනහමාරෙන් පසුව හොරණෑ සත පිඹීම සහ පාත්‍රය පොළවට හෙළීම සිදුවන්නේය. සභාව හා උන්වහන්සේගේ සෙනඟ මේ කාලය තුළ ඔසවාගනු ලබනවා ඇත. පළමු මුද්‍රා පතෙහි සිදුවීම දැනට ලෝකයෙහි සිදුවෙමින් පවතිනවාක් මෙන්, ඉතිරි වූ සියලු දේද සිදුවන බවට අපට පැහැදිලිවම කිව හැකිය.

## භූමිකම්පාව, ඉර අඳුරුවීම හා සඳ ලේ වීම

පළමු ශතවර්ෂයේ සිට භූමිකම්පාවෙන් බොහෝ දේ සිදු විය. වසර 10 කට පෙර ඉන්දියාවේ ගුජරාති ප්‍රාන්තයේ විශාල භූමිකම්පාවක් සිදු වී සිය ගණන් මිනිසුන් මරණයට පත් විය. සිය ගණන් මනුෂ්‍යයන්ට ඔවුන්ගේ නිවස් අහිමි විය. මෑතකදී ජපානයේ ෆුක්ඩීම් නගරයේ විශාල භූමිකම්පාවක් සිදුවී න්‍යෂ්ඨික කර්මාන්ත ශාලාවක් සම්පූර්ණයෙන්ම විනාශයට පත් විය. 2004 වර්ෂයෙහි ඉන්දුනීසියාවේ ඇති වූ භූමිකම්පාවෙන් පසු නැවත සුනාමියක් පැමිණ ලක්ෂ ගණන් සෙනඟගේ ජීවිත අහිමි විය. ඉන්දියාව, ශ්‍රී ලංකාව, තායිලන්තය වැනි රටවල් විශාල ලෙස මේ භීෂණයට මුහුණ දුන්නේය. ඉන්දියාවේ නැගෙනහිර පළාතේ ලක්ෂ එකහමාරකට වඩා වැඩි සෙනඟක් මිය ගියා. නිතරම පාහේ ලෝකයේ බොහෝ ස්ථාන වල භූමිකම්පාවක් ඇති වෙමින් පවතී.

ග්‍රහලෝක අතර විශාලතම ග්‍රහලෝකය වන සූර්යාය. වසර 50 පමණ කාලයක් පුරාවටම බ්‍රිතාන්‍යයේ සිටින ඉතා ප්‍රසිද්ධ විද්‍යාඥයෙක්වූ ස්ටීවන් හාව්කින්ස් සූර්යයාගේ තිබෙන පීඩනය නිසා එහි සෑම තැනම කලු පැල්ලම් ඇති බව පවසා තිබුණි. නාසා (NASA) ආයතනයේ බොහෝ විද්‍යාඥයින් මෙය සත්‍ය බව පිළිගෙන ඒ සම්බන්ධව පරීක්ෂණ පවත්වමින් සිටී. මෙවැනි කලු සිදුරු ඇති බවත් එය විශාල මිටියාවතක් මෙන් වීමට ද ඉඩ කඩ තිබේ. මෙවැනි දේ වන විට හිරුගේ රශ්මිය වැඩි වීමට ද ඉඩ කඩ තිබේ. මේ නිසා පෘථිවියට හා අනෙකුත් ග්‍රහ ලෝක විශාල හානියක් ඇති වීමට ද පුලුවනි.

2022 ජනවාරි මස 29 දින ඇන්ටාක්ටිකා මහද්වීපයේ හා ග්‍රීන්ඩන්ඩ් දූපතේ නිතරම අයිස් වලින් පිරී තිබෙන්නේ එහි වර්ෂාව නැති නිසාය. නමුත් උෂ්ණත්වය වෙනස්වීමක් නිසා මෙහි තිබූ අයිස් කඳු දියවීමට පටන් ගනිමින් තිබුණි. එම නිසා සෙනඟව ආරක්ෂිත ස්ථාන වලට ගෙන යාමට සිදුවිය. ඉන්දුනීසියාව තමාගේ අගනුවර වූ ජගාතාර් වෙනත් ස්ථානයකට ගෙනයාමට සැලසුම් කර තිබේ. දැනටමත් ලක්ෂ 20ක් පමණ සෙනග එම ස්ථානයෙන් ඉවත් කර ඇත.

දැනට සූර්‍යයාගෙන් 12% ක පමණ කළු සිදුරු තිබුණත් එය 100% ක්ම පැතිරී යන බව විද්‍යාඥයින් පවසනවා ඇත. මෙය සිදුවන විට බයිබලයෙහි පවසා ඇති දේ සත්‍ය වෙනවා.

දෙවියන්වහන්සේ ලෝකය මවන විටදී අහස්තලයට ස්ථර තුනක් දමා හිරුගේ රශ්මිය පාලනය කිරීමට සැලැස්විය. පළමු දෙය වතුර, දෙවියන්වහන්සේ නෝවාගේ කාලයේ ජල ගැල්ම කරණකොටගෙන පොළොවේ තිබූ වතුර ඉවත් කරන ලදී. දෙවන ස්ථරය වන ඕසෝන්, අද කාබන්ඩයොක්සයිඩ් ආදී වායු කරණකොටගෙන මහත් විශාල ප්‍රමාණයක් පලුදු වී ඇත. තුන් වන ස්ථරය ආකර්ශන ශක්තිය රඳවා ගැනීමද අද පලුදු වෙමින් පවතී.

කර්මාන්තශාලා තිබෙන බොහෝ රටවල දැනටම UNO මගින් අවවාද කරමින්, අප මේවා ආරක්ෂා නොකළහොත් වසර 30 ක් ඇතුළත දී අප බොහෝ අමාරු තත්ත්වයකට මුහුණ දෙන බවයි.

හිරුගෙන් හානිවන අනෙක් ප්‍රාන්තය නම් ආක්ටික්

මහද්වීපයයි. මෙහි දැනට උෂ්ණත්වය දැඩිව පවතී. බලාපොරොත්තු නොවූ අන්දමකට යුරෝපීය රටවලත් චීනයත් වර්ෂාපතනය ඉතා අධික වෙමින් පවතී.

මෙවැනි තත්ත්වයක් හිරුගේ පවතින නිසා ලෝකයේ රටවල් අද භයෙන් ජීවත් වෙති. ඇමරිකාව සියයකට වැඩි ආරක්ෂිත බංකර් කඳුවල සාදමින් සිටී. හැම බංකරයක්ම ගැඹුරින් අඩි 1400 සිට 2000 දක්වා වෙයි. හැම බංකරයකම කුඩා නගරයක් ලෙස පහසුකම් සලසා ඇත. ඩොලර් ලක්ෂ 2 ක් ගෙවා එක් පවුලකට මාස 4 ක් හෝ 6 ක් දක්වා කාලයක ජීවත් වීමට හැකිය.

බොහෝ යුරෝපීය රටවල් දැනටම මෙවැනි බංකර් සෑදීමට පටන් ගෙන තිබේ. නෝර්වේ, ස්විට්සර්ලන්ඩ්, ස්වීඩන් යන රටවල් ද මේවා දැනටමත් ක්‍රියාත්මක කරමින් සිටී. නමුත් විශාල භූමිකම්පාවන් හා ගිණිකඳු ඇතිවන විට කී දෙනෙකුට මේ බංකර් වලට ආරක්ෂාව දිය හැක්කේ 4 ක් හෝ 6 ක් පමණද? මන්ද දෙවියන්වහන්සේගේ සැලැස්ම මනුෂ්‍යයාට විනාශ කර දැමීමට නොහැකිය.

2022 පෙබරවාරි මස 28 වන දින ලෝකයේ කාලගුණය වෙනස්වීම නිර්දේශ කරන්නාවූ කණ්ඩායම නිකුත් කරන පොතෙහි සඳහන් කර ඇත්තේ එන්න තිබෙන්නා වූ කාලවල ලෝකයේ තිබෙන උෂ්ණත්වය 1.5% ක් හෝ ඊට වඩා වැඩි අගයකින් ඉහල යන බවයි. දැනටම ඉන්දියාවේ බොහෝ තැන්වල 35c° - 36c° දක්වා බව සඳහන්ය.

තවත් භයානක දෙයක් නම් පරමාණු බෝම්බ, රසායනික ද්‍රව්‍ය පොළොවේ වළලා තිබීමයි. භූමි කම්පාවන් ඇතිවන විටදී මේවා පුපුරා යාමටද ඉඩකඩ ඇත. ඉන්දියාව වැනි බොහෝ රටවල් වල LPG ගෑස් නළ මාර්ගයන් ඔස්සේ යොදා ගන්නා බැවින් මෙවැනි දෙයක් සිදු වූ විටදී ඒවා පුපුරා විශාල හානියක් සිදුවෙනු ඇත.

ලෝකයේ බොහෝ රටවල මිනිසුන් ඉර රතු පාටින් දිස් වන ආකාරය දැක ඇති අතර ඉන්දීය මිනිසුන්ද එය දැක ඇත.

දේව වචනයෙහි ලියා ඇති ලෙස අත්තික්කා ගසේ ගෙඩි වැටී යන්නාක් මෙන් අහසේ තාරුකා ද වැටී යන්නේය. දැනටමත් බොහෝ තාරුකාවන් වැටී ගොස් ඇත. උෂ්ණත්වය අධික ලෙස ඉහල යමින් පවතින නිසා අහස පැදුරක් මෙන් හැකිලී යයි.

මෙවැනි දේ සිදුවන විට මිනිසුන් තම ගෙවල් අතහැර කඳු දෙසට දිවීමට සිදුවෙනු ඇත. ***එළිදරව් 13: 16-18*** දක්වා ඇති කොටසෙහි ලෝකයේ සිටින ලොකු කුඩා සියළු දෙනාම මෘගයාගේ අංකය ගත යුතුය කියා සඳහන් ව ඇත. දැනටම ලෝකයේ බොහෝ රටවල් කාඩ් භාවිතය හරහා මෙයට පෙර පුහුණුවක් ලෙස ක්‍රියාත්මක වෙයි. අපගේ දුරකථන අංකය, බැංකු ගිණුම් අංකය යන සියල්ලම අංක 16 ක් තිබිය යුතුය කියා තීරණය කරයි. එසේම පරිගණක කෝඩ් එකටද අංක 18 ක් තිබිය යුතුය. අවසානයේ මේ සියල්ලම 666 යන අංකය යොදා ගැනීම දක්වා ගමන් කරනු ඇත. මේ අවසානයේදී මෙම අංකය යෙදූ බයෝ චිප් එක අපගේ ශරීරයේ දකුණු අතට හෝ නළලට ඇතුලු කිරීමට සියල්ල සූදානම් කර ඇත.

මේ සියල්ල තුළින් අපට පෙනී යන්නේ අප වසර 7 ක පීඩා කාලයකට මුහුණ දීමට යන බවයි. තවත් විශාල පීඩාවන්ද ඉදිරියේදී සිදුවීමට නියමිතය. එක් දේව දාසයෙක් මෙලෙස ගීතිකාවක් ලියා ඇත.

1. දෙවියන්වහන්සේගේ හමුදාව ස්වර්ගයේ සිට ලක්ෂ
ගණන් පැමිණෙනවා. මිනිසුන් ගුහා වලට දුවනවා
තාරුකාවන් ඔවුන්ගේ ස්ථාන වෙනස් කරයි ලෝකයේ
හැම තැනකටම ඔවුන් වැටෙයි.
නමුත් මා හලේලුයියා කියා ගයමින් මගේ
ස්වාමින්වහන්සේ සමග එකතු වෙනවා

2. මහද්වීප පහේ අවසානයට පැමිණෙනවා
අකුණු වදිනවා අන්ධකාරය ලෝකය ආක්‍රමණය කරනවා
හැම තැනම වැලපීම හා ඇඬීමය. නමුත් ගැලවීමේ
සාක්ෂිය ශුද්ධවන්තයින්ගේ හදවතේ පවතිනවා මුහුද
සැරවෙනවා, නැව් ගිලෙනවා. විශාල විනාශයක් ඇති
වෙනවා. සෑම ප්‍රවාහනයම නවතිනවා. ලෝකය
සම්පූර්ණයෙන්ම නැති වෙනවා. විනාශ වෙනවා. දේව
වචනය සදහටම පවතිනව

ගායනය :- ජේ. එමිල් ජෙබ සිං

9 වෙනි පිටුවට ...

**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for** BIBLECOR

We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**



The Chairman, Nehemiah Bible College, Echo of His Call, Post Box 2957, CHEPAUK, CHENNAI - 600 005.
Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

**''...කියවන්නා තේරුම් ගනීවා....''** *(මතෙව් 24:15)*

## දෙවියන්වහන්සේගේ ආකෘතිය

වර්ෂ 1962 සිට 1965 වන වසර දක්වා ඉරේනියල් නම් රජයේ පාසලේ 9 වන ශ්‍රේණිය දක්වා මා ඉගෙනුම ලැබුවෙමි. ඉන් පසුව මා ලක්ෂ්මිපුරම් යන ස්ථානයෙහි පිහිටා තිබූ විශ්ව විද්‍යාලයෙහි මගේ ඉගෙනීමේ කටයුතු ඉදිරියට කරගෙන ගියෙමි. ඒ කාලයේදී යමුනා මන්දූර් යන ස්ථානයෙහි දේව ගැති Dr. A. සෙල්වරාජ් මිශනාරිවරයෙකු ලෙස සේවයෙහි යෙදී සිටියේය. ඔහු ද මා සමග මෙම විදුහලෙහි සේවය කරනු ලැබුවේය. ඔහු මගේ ආත්මික ජීවිතයට ආදර්ශයක් ද විය.




Rev. Dr. A. Selvaraj

ඔහු මගේ මිත්‍රයෙක් පමණක් ද නොව ඔහු මගේ සේවය ධෛර්‍යමත් කරන පුද්ගලයෙක් බවට ද පත්වූවා. තවද ඔහු මගේ යාච්ඤා ජීවිතයේ වර්ධනයක් ඇති කිරීමට ද උපකාරී විය. යක්ෂයාගේ උගුල්වලට වැටීමට නොදී ලෝකයේ පවතින නපුරු ක්‍රියාවන් වලට ඇබ්බැහි නොවීමට හා ශුද්ධ වූ ජීවිතයක් ගත කරන පිණිස දෙවියන්වහන්සේ අපට උපකාර කලේය.

මේ කාලයේදී මාගේ පවුල ආර්ථික ලෙස බොහෝ ප්‍රශ්නවලට මුහුණ දුන්නෙමි. එනිසා රොස්ලට් නම් මගේ නැන්දා මා හට සෑමදාම කෑම ලබාදෙමින් උපකාර කළේය. ඇය ද ඇගේ දරුවන් වන සහෝදර ප්‍රින්ස් සහෝදර ජෙස්මින් සහෝදර වයිස් හා බාල සහෝදරිය වන සහෝදරී ඩොටී මාව ඉතා හොඳින් බලා ගත්තේය. ඔවුන්ගේ ජීවිත කරණකොට ගෙන දේව භය මා මගේ ජීවිතයට ඉගෙන ගත්තෙමි.

මේ කාලය තුලදී මා හට තිබූ ආශාව නම් ඉතා යහපත් චරිතයක් තිබෙන යහපත් වු පුද්ගලයෙක් වීමයි. එම නිසා දෙවියන්වහන්සේ උදෙසා කුමන හෝ යහපත් දෙයක් කිරීමට මා නිතරම ක්‍රියා කලෙමි. දේව වචනයේ මෙසේ පවසා ඇත. ***''මක්නිසාද දෙවියන්වහන්සේගේ යහපත් කැමැත්ත නිසා කැමති වෙන්ටත් වැඩ කරන්ටත් නුඹලා තුල ක්‍රියා කරන්නේ දෙවියන්වහන්සේමය.'' (පිලිප්පි 2:13)*** මාගේ බලාපොරොත්තුව නම් අවංක ජීවිතයක් ගත කරන ස්වාමින්වහන්සේ උදෙසා සේවයක් කරනු ලැබීමය. එම නිසා ලෝකයේ සිටි මිත්‍රයින් හා නෑදෑයින් මා අත්හරිනු ලැබුවා.

මගේ තරුණ කාලෙයේදී ද දෙවියන්වහන්සේ හැර මා වෙන කිසිම දෙයකට ආශා වූයේ නැත. පාසලේ දී ලෝකය ගැන කිසිම දෙයක් නොදන්නා වූ පුද්ගලෙකු ලෙස මාව සලකනු ලැබුවේය. නුමුත් මා මෙසේ තීරණය කර ගත්තෙමි. ***''මක්නිසාද යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සහ උන්වහන්සේ කුරුසේ ඇන ගසනු ලැබූ බවක් මිස වෙනි කිසිවෙක් නුඹලා අතරේ නොදැන සිටින්නට නියම කර ගතිමි.'' (1 කොරින්ති 2:)*** දෙවියන්වහන්සේ මගේ මනසත් මගේ හදවතත් උන්වහ්නසේ ගැන පමණක් සිතීමටත් උන්වහන්සේ වෙනුවට ජීවිත් වීමටත් මාව යොමු කළේය. ශුද්ධාත්මයාණන් වහන්සේ මාගේ දුර්වලකමේ දී මට උපකාර කළේය.



S. Sam Selva Raj
**Age : 18**

උදාහරණයක් ලෙස මා වැරදිලා හෝ යම් යම් දේට ඇහුම් කන් දුන්නහොත් යම් චිත්‍රපටයක් බැලුවහොත් ඒවා මගේ ඇස් වලින් දැක්කත් මගේ කන් වලට ඇහුනත් ඒවා මගේ හදවත තුලට ඇතුල් නොවුනේය. මෙවැනි ලෝකයේ දේවල් මගේ ජීවිතයෙන් ප්‍රතික්ෂේප කරන බව මට හැගුණි. ***''ඒ හැටියට, මම ප්‍රඥාවන්තයන්ගේ ප්‍රඥාව නැති කරන්නෙමි. බුද්ධිමත් අයගේ බුද්ධිය පහ කරන්නෙමි'' (1 කොරින්ති 1:19)***

ලෝකයේ මිනිසුන් මාව පිළිගන්නේ නැත. නුමුත් මා ඒ ගැන මා කනස්සල්ලට පත් නොවෙමි. මගේ ස්වාමින් වහන්සේ උදෙසා මගේ කැප වීම කොපමණ මහත් ද කියා මගේ හදවත දනී. මා ලෝකයේ ජීවත් වූවද මා ස්වාමින්වහන්සේ උදෙසා වෙන් වූ ජීවිතයක් ගත කරමි.

***''නුමුත් ලියා තිබෙන ලෙස දෙවියන්වහන්සේ විසින් තමන් ප්‍රේම කරන්නන්ට සූදානම් කල දෙයක් ඇත් ද ඒ දේ ඇසට නොපෙනුණේය. කණට නොඇසුණේය. මනුෂ්‍යයාගේ සිතට නොපැමිණේය. නුමුත් දෙවියන්වහන්සේ ස්වකීය ආත්මයාණන් වහන්සේ කරණකොටගෙන අපට ඒ දේ එළිදරව් කළ සේක. මක්නිසාද ආත්මයාණන්වහන්සේ සියළු දේ එසේය. දෙවියන්වහන්සේගේ ගැඹුරු දේවල් විමසන සේක.***

***මනුෂ්‍යයෙකුගේ කාරණා මනුෂ්‍යයා තුළ තිබෙන ඔහුගේ ආත්මය හැර මනුෂ්‍යයන් අතරේ වෙන කවරෙක් දන්නේද එසේම දෙවියන්වහන්සේගේ***

***කාරණා දෙවියන්වහන්සේගේ ආත්මයාණන් මිස වෙන කිසිවෙක් නොදනී.***

***නුමුත් දෙවියන්වහන්සේ විසින් අපට දෙන ලද දේ අප විසින් දැන ගන්නා පිණිස ලෝකයේ ආත්මය නොව දෙවියන්වහන්සේගෙන් වූ ආත්මය ලැබීමුව.'' (1 කොරින්ති 2:9-12)***


Mr. C. Selvam

නෙයූර් හි වානිජ්‍ය ආයතනයක් පිහිටෙවූ නැසී ගිය සී. සෙල්වම් නැමැත්තා මගේ ජීවිතයෙහි දෙවියන්වහන්සේගේ සැලැස්මක් තිබෙන බව දැන ගත්තේය. ඔහු මගේ තත්ත්වය දැනගෙන පරිපාලන අංශය පිළිබඳව ඉගෙන ගැනීමට ඔහු මාව පුහුණු කළේය. ඉංග්‍රීසි භාෂාවෙන් හා දෙමළ භාෂාවෙන් ෂෝට් හෑන්ඩ් ඉගෙන ගැනීමට මා හට උපකාර කළේය.


Mr. Gilbert Roy

ඔහු පැවසූ දෙයක් නම් ''ඔබ දෙවියන්වහන්සේගේ ඉතාහොඳ දාසයෙක් වී හොඳ පරිපාලකයෙක් ද වෙයි'' කියාය. එසේම ඔහුට උපකාර කරන ගිල්බට් රෝයි මහතාට ඔහු කතා කර මා ඉතා හොඳින් පුහුණු කරන්නය කියා පැවසීය. දැන් ඔහු කිතුණු ආයතනයක සභාපති වරයෙකු ලෙස කටයුතු කරයි.

***''එක මැටි පිඩෙන් එක් භාජනයක් ගෞරවය පිණිසත් අනෙකක් අගෞරවය පිණිසත් සාදන්ට කුම්බකාරයාට මැටි කෙරෙහි බලය නැත් ද'' (රෝම 9:21)***

මේ වචනයට අනුව දෙවියන්වහන්සේ මාව හැඩ ගැසූ සේක.

************

*7 පිටුවෙන්....*

## ස්වාමීන්ගේ දවස

මීට වසර 2000 කට පෙර යේසුස්ක්‍රිස්තුස්වහන්සේ ඉතා යටහත් පහත් ගැලවුම්කාරයෙක් ලෙස පළමු වතාවට මේ ලෝකයට පැමිණුනේය. උන්වහන්සේගේ යටහත්කම පෙන්වන පිණිස උන්වහන්සේ බූරුවෙකු පිට ගමන් කළේය. *(සෙකරියා 9:9)* නමුත් උන්වහන්සේ ප්‍රසිද්ධියේ දෙවන වතාවට මේ ලෝකෙට පැමිණෙන විට උන්වහන්සේ තම ශුද්ධවන්තයන් සමග ඔලිව් කන්දට එන්නේය. *(සෙකරියා 14:4)* ඒ දවස උදහසේ දවසකි. පීඩාවේ දවසකි.

*''ඒ දවස වනාහි උදහසේ දවසක්ය,*
*දුක්ඛිත වූ විපත්ති දවසක්ය. නාස්තිවීමේ හා සුන්නත් වීමේ දවසක්ය. අන්ධකාර වු කළුවර වූ දවසක්ය. වළාපටලද ඝනාන්ධකාරයද ඇති දවසක්ය. ස්වාමීන්වහන්සේගේ උදහස් දවසේදී ඔවුන්ගේ රිදී නිසාවත්, රන් නිසාවත් ඔවුන්ට ගැලවෙන්ට නුපුළුවන. උන්වහන්සේගේ ජ්වලිත ගින්නට මුළු දේශය විනාශවන්නේය. මක්නිසාද උන්වහන්සේ දේශයේ වසන සියල්ලන් පිටට අන්තිමයක්, එනම් භයානක අන්තිමයක් පමුණුවනසේක. (ශෙපනියා 1: 15,18)*

*''බලාපල්ලා උන්වහන්සේ වළාකුල් වලින් එනසේක. සියළු ඇස්ද, උන්වහන්සේට ඇන්න අයද උන්වහන්සේව දකින්නෝය. පොළොවේ සියළු ගෝත්‍රද උන්වහන්සේ නිසා වැලපෙන්නෝය. එසේය, ආමෙන්'' (එළිදරව් 1:7)*

අපගේ ස්වාමින් වූ යේසුස්වහන්සේ විරුද්ධ ක්‍රිස්තුස්ගේ වසර 7 ක පාලනයෙන් පසු ඔලිව් කන්දට පැමිණෙන සේක. යේසුස්වහන්සේගේ පළමු පැමිණීමේදී උන්වහන්සේ ගැලවුම්කරු ලෙස ඉතා යටහත් පහත් ලෙස මේ ලෝකයට පැමිණි නමුත් උන්වහන්සේ දෙවෙනි වර පැමිණෙන විටදී උන්වහන්සේ රජුන්ගෙත් රජු ලෙසත් ධර්මිෂ්ට විනිශ්චයකරු ලෙසත් ශුද්ධවන්තයින් දහස් ගණනක් පිරිවරාගෙන සුදු අශ්වයන් දහස් ගණනක් ද ඇතිව පැමිණෙන්නේය. *(එළිදරව්19: 11-14)*

***''මක්නිසාද උන්වහන්සේ එන සේක, පොළොව විනිශ්චය කරන පිණිස එන සේක. උන්වහන්සේ ධර්මිෂ්ඨකමෙන් පොළොව ද ස්වකීය සැබෑකමෙන් මනුෂ්‍ය වර්ගයන් ද විනිශ්චය කරන සේක.'' (ගීතාවලිය 96:13)***

ශුද්ධවන්තයින්ව ඔසවා ගත් පසු කරුණාවේ කාලය නිමාවනු ඇත. එකිනෙකාගේ ක්‍රියාවන්ට අනුව ඔවුන්ව විනිශ්චය කරනු ලබයි. යම් කෙනෙක් ගැලවීම ලැබීමට කැමැති වුවත් එය ඔහුට ලබා ගැනීමට නොහැකි වන්නේය. මන්ද කරුණාවේ දොරටුව වසා දමා ඇත. නමුත් ඔහු දේව රාජ්‍යයට ඇතුල් වීමට කැමැත්තක් දක්වන්නේ නම් ඔහු වේද සාක්ෂිකාරයෙක් ලෙස මරණයට පත්විය යුතුය.

**Echo of His Call - YouTube** Please subscribe

Kindly view and subscribe our
Echo of His Call YouTube Channel
when you get time. Thanks.
- Editor

RNI NO. TN/SIH/2006/17846

මෙතැන් පටන් ඔසවා ගැනීම කොයි මොහොතකදී හෝ සිදු විය හැක. ඒ නිසා අදයි ඔබගේ ගැලවීමේ දවස, ගැලවීම දෙවියන්වහන්සේගේ මහත් වූ දීමනාවකි. *(රෝම 6:23)* ගැලවීම පුද්ගලික වූ දෙයකි. හැම පුද්ගලයෙකුම එය පුද්ගලික ලෙස ගලා ගත යුතුය. අද ඔබට මෙය ලබාගැනීමට හැකි වන්නේ ක්‍රිස්තුස්වහන්සේගේ ලේ කරණකොට ගෙන පමණි. ලොකේයෙන් ඔබට පැමිණෙන්නේ මරණයයි. නමුත් ක්‍රිස්තුස්වහන්සේ කරණකොට ඔබට ලැබෙන්නේ ජීවනයයි. ඔබ යේසුස්වහන්සේ දෙස බලා ඔබගේ පාපය උන්වහන්සේට කියා දෙනවා නම් උන්වහන්සේ තුලින් ඔබට ජීවනය ලැබෙන්නේය. ***"නුමුත් උන්වහන්සේ ආලෝකයෙහි සිටින්නා සේම අපිත් ආලෝකයෙහි හැසිරෙමු නම්, "අපට එකිනෙකා සමඟ පංගුකාරකම ඇත්තේය. උන්වහන්සේගේ පුත්‍රවූ යේසුස්වහන්සේගේ ලේද සියලු පාප වලින් අප පවිත්‍ර කරන්නේය." (1 යොහාන් 1:7)*** ඔබ මේ දේ කරනවා නම් ස්වාමින්වහන්සේගේ උදහසින් ගැලවී දේව රාජ්‍යය අත්පත් කර ගැනීමට පුළුවන. තවත් මෙය පසුවට කල් නොදමන්න අදම ක්‍රියා කරන්න.

විරුද්ධ ක්‍රිස්තුස්ගේ පැමිණීම අද ලෝකයට ලංවී තිබේ. ඔහුගේ වසර 7ක පාලනය ඉතා ඉක්මනින් පැමිණෙනු ඇත. නමුත් විරුද්ධ ක්‍රිස්තුස් අවසානයේදී අර්ගෙදොන්හි දී යේයුස් වහන්සේ උන්වහන්සේගේ ශුද්ධවන්තයින් සමග පැමිණ ඔහුව විනාශ කරනු ලබයි. ***(සෙකරියා 9:13)*** එය එක් දවසක යුද්ධයකි. විරුද්ධ ක්‍රිස්තුස් හා ඔහුගේ කණ්ඩායම ස්වාමින්වහන්සේ ගින්නට දමනු ලබයි. සාතන්වද වසර 1000 කට සිරගෙයි දමනු ලබයි. ***(එළිදරව්ව 20:1-2)***

යේසුස්වහන්සේගේ ඒම ඉතාම ආසන්නව තිබේ. උන්වහන්සේගේ ඒමේදී ඔසවා ගැනීමට සූදානම් වන්න. ස්වාමින්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක්වා.

************

## කැඳවීමේ ප්‍රතිරාවය

සෑම මසකම භාෂා 16 කින් නිකුත් වන සඟරාව, බයිබල් විද්‍යාලය, තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව, සභා රෝපණය, පාසැල් අධ්‍යාපනික සේවය, සුභාරංචි රැස්වීම් මාලා, සම්මේලනය පැවැත්වීම ආදිය.

වාර්ෂික දායකත්වය - රු. 100/-  
ජීවිත දායකත්වය - රු. 2000/-

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ විවිධාකාර සේවාවන් අප පවත්වාගෙන යනු ලබන්නේ ඔබගේ උපකාරයන් හා ස්වේච්ඡාවෙන් ඔබ දෙන සම්මාදන් හා දීමනා කරණකොටගෙනය. ස්වාමීන්වහන්සේ ඔබට මඟපෙන්වන්නාවූ ආකාරයෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයට උපකාර කිරීමට ඔබටද හැකිය. ඔබ දෙන්නාවූ උපකාර කරණකොට ගෙන දෙවියන්වහන්සේව නොදන්නාවූ සෙනඟට සුභාරංචිය ප්‍රකාශ කිරීමට උපකාර වෙනවා ඇත.

ඔබට මෙම සඟරාව අවශ්‍ය නම්, කරුණාකර අපට දන්වා එවන්න. ඔබගේ ඊ-මේල් ලිපිනය හා දුරකථන අංකයද, එසේම ඔබගේ ලිපිනය වෙනස් කරනවා නම් එම වෙනස් වූ ලිපිනයද අපට දන්වා එවන්න.

අපගේ වෙබ් අඩවියට ගොස් මෙම භාෂා 16 කින් ඇති සඟරාවන් බලා ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබගේ ලිපි, යාච්ඤා ඉල්ලීම් සහ ඔබගේ උපකාරයන් පහත ලිපිනයට අප වෙත එවන්න.

කරුණාකර ඔබගේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය හා ලිපිනය අප වෙත එවන්න.

**ECHO OF HIS CALL**  
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA  
PH: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98412 71858, 98410 71852  
E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in  
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**  
**Date of Publication: First week of every month**  
**Date of Posting : 1st & 2nd of every month**  
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**  
on 2nd MAY 2022.

**If un-delivered please return to:**  
**ECHO OF HIS CALL (SINHALA)**  
**P.O. Box No. 2957,**  
**Chepauk, Chennai - 600 005, INDIA.**  
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

## JESUS LOVES YOU!

To

GOD BLESS YOU!

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No. 18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by him at **Echo of His Call Printers**, New No. 8 & 10, Old No. 18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**